CFHC

# ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

## පුරප්පාඩු.

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අභ්‍යන්තරයෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

**01. තනතුර** : සාමාන්‍යාධිකාරී ( **HM 2-1)**

සුදුසුකම් : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) / නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) / නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමුච්චය කළමණාකාර) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර 05 ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සමග

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහි ලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමණාකරණයෙහි ලා නිශ්චිත ප්‍රවීණතාවය.

වැටුප් පරිමාණය : HM 2-1 - රු. 91,645 - 12 x 2,700 - 124,045

02. **තනතුර** : ගණකාධිකාරී ( **MM 1-1 )**

(පහත 01 හෝ 02 හෝ 03)

සුදුසුකම් : 01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය / කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

02. වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ වරලත් කළමණාකරණ ගණකාධිකාරි ආයතනයේ අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත් වී තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

03. "කණිෂ්ඨ කළමණාකාර" JM සේවා ගණයෙහි අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 - රු. 53,175 - 10 x 1,375 - 15 x 1,910 - 95,575

03. තනතුර : **නියෝජ්‍ය වරාය කළමනාකාර (JM 1-1 )**

**<u>පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4 හෝ 5 හෝ 6 හෝ 7</u>**

සුදුසුකම් : 01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය, වානිජ්‍ය, ආර්ථික විද්‍යාව හෝ ගණකාධිකරණය, විද්‍යාවේදි උපාධියක් ලබා තිබීම.

02. තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක ගැලපෙන්නාවු පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත් වීම.

03. තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි (NVQ) හත් වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

04. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හය වැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතියක් ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

05. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස් (05) වැනි මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

06. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-2) සේවා ගණයේ II වන ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

07. කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-2) සේවා ගණයේ II වන ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.